*Vidyodaya J. Arts, Sci., Lett.*, *Vol.* 6. *No.* 2, *pp.* 49-62, 1978

# දෙවොල් මඩුව: සශ්‍රීකත්ව වර්ධක ශාන්තිකර්මයක්

විද්‍යෝදය මණ්ඩපයේ සිංහල අධ්‍යයනාංශයේ
**තිස්ස කාරියවසම් විසිනි**

ලංකාවේ පහතරට ප්‍රදේශවල මෙන්ම සබරගමු දිස්ත්‍රික්කයෙහි ද අතිශයින් ප්‍රචලිත 'මඩු' නමින් හැඳින්වෙන ශාන්ති කර්ම විශේෂයක් ඇත.[1] මෙම මඩු ශාන්තිකර්ම අතර දෙවොල් මඩු, ගම්මඩු, හැල්ලුම් මඩු, කිරිමඩු, පූනාමඩු, පාන්මඩු, මල්පහන් මඩු, දම්මඩු, දේවාල මඩු, ගී මඩු, (තුන් ද ගී මඩු, හත් ද ගී මඩු) හා ගරා මඩු[2] ඒ ඒ ප්‍රදේශවල ප්‍රසිද්ධියට පත් ව තිබේ. මේ හැම මඩු ශාන්ති කර්මයකදී ම පත්තිනි දේවතාවිය ද සම්භාවනීය තත්වයක් භජනය කරන්නීය. මෙරට ශාන්තිකර්මවල සහ ඇදහිලිවල පුද පූජා ලබන එකම ශුභදායක දේවතාවිය ද පත්තිනි යයි[3]. සෙස්සෝ දෙවිවරුය. දෙවොල් මඩුව යන අභිධානයෙන් දැක්වෙන පරිදි මෙම තෝත්‍රය[4] දෙවොල් දෙවියන් වෙනුවෙන්ම පැවැත්වෙන්නකියි හැඟී යාමට ඉඩ ඇතත් මේ ශාන්තිකර්මයද පත්තිනි දේවතාවියට මුල් තැන දී ඇගේ අනුචර දෙවියකු ලෙස දෙවොල් දෙවියන්ට කරන පූජා කර්මයක් සේ සැලකීම වඩාත් උචිතය.

දෙවොල් මඩු පූජාව සඳහා විශේෂ මඩුවක් සකස් කැරෙයි. එය දිගින් සැට රියනක්ද පළලින් සතළිස් රියනක් ද විය යුතුයැයි මඩුපුර කවිවල කියැවෙයි. ගොවි කුලයෙහි අය වෙනුවෙන් මඩුපුර කවිවල නියම කරන ලද කලස් තොරණ මිනිස් ලොවදී

1. කොහොඹා කංකාරිය වැනි ශාන්තිකර්ම ගැන දේශීය හා විදේශීය විද්වතුන් විසින් කරන ලද පර්යේෂණ ආශ්‍රිතව ලියැවුණු ලිපිලේඛන රාශියක් විද්‍යමාන වෙතත් මෙම ශාන්තිකර්ම වැඩි අවධානයකට ලක් වී නැත. ගම්මඩුව හා පූනා මඩුව ගැනත් දෙවොල් දේවාලය ගැනත් ලියැවුණු ලිපි කිහිපය බලන්න.
   C. M. Austin De Silva, The Sinigama Devale at Hikkaduwa, *Ceylon Fortnightly Review*, Vol. 5 No. 24 (1953) pp. 23-31
   W. A. De. Silva, Gammaduwa or Village Dance, *Ceylon Magazine*, Vol. 1 No. 6 (1841) pp. 256-257
   Gunanath Obeysekere, The Pataha Ritual Genesis and Function, *Spolia Zeylanica*, Vol. 30 No. 23 (1965), pp. 279-296
   U. A. Gunasekera, Puna Maduwa or the Scapegoat Idea in Ceylon, *Spolia Zeylanica*. Vol. 27, No. 1 (1953) 63-74pp.
   පන්තිස් කෝල් මුරකවි, සංස්. පී. බී. ජේ. හේවාවසම් සහ පරවාහැර සද්ධාජීව හිමි. (1974) ප්‍රදීප ප්‍රකාශකයෝ
2. කෝල්මුර කවි පොත් තිස්පහ අනුරූපණය කරනුයේ ගම් මඩුවෙහිදීය. හැල්ලුම් මඩු හා කිරිමඩු ගවයන්ගේ ආරක්ෂාව පතා කරන ශාන්තිකර්මයකි. වස්දෙස් එකතු කොට පූනාවට බස්වන්නේ පූනා මඩුවෙහිදීය. තොරණ රහිතව පහන් පූජාවකින් පත්තිනිය පුදන්නේ මල් පහන් මඩුවල සහ පහන් මඩුවලය. දම්මඩු කතරගම දෙවියන්ට දානය දීමට ගම්පහ ප්‍රදේශයේ පවත්වන්නකි. පත්තිනි දේවාල මුල් කර ගෙන පවත්වන්නේ දේවාල මඩුයි. ගී මඩුවල නැටුම් විරලය. ගරා මඩුව ධීවර ජනතාව වාරකන් කාලය ඉවර වී හරාව ලබත් ම වැල්ලේ කරන පූජාවකි.
3. පත්තිනි දේවතාවිය හැරුණු විට ශාන්ති කර්මවලදී මුහුදු මණිමේඛලාවහා භද්‍රකාලී ඇදහීමක් ගැන කියැවෙයි. භද්‍රකාලී හා ඇගේම අවතාර ලෙස සැලකෙන සොහොන්කාලි, සූනියන් කාලියද අංජනම් බැලීම වැනි කටයුතුවලදී හා පලිගැසීම්වලදී ප්‍රමුඛ වෙති. එහෙත් මණිමේඛලා ඇදහීමක් ධීවරයන් අතර පවා දක්නට නොමැත.
4. තෝත්‍ර යන්න සංස්කෘත ස්තෝත්‍ර යන පදයෙන් බිඳී ආවකි. යකුන්ට කරනු ලබන ශාන්තිකර්ම තොවිල් ලෙසද, ග්‍රහයන්ට කරන ශාන්තිකර්ම බලි ලෙසද, පත්තිනි ප්‍රමුඛ දෙවොල් දෙවියන් වෙනුවෙන් කරනු ලබන මඩු ශාන්තිකර්ම තෝත්‍ර ලෙසද හැඳින් වෙන ව්‍යවහාරයක් පහතරට තිබේ.

කුල භේදයෙන් තොරව සියලුදෙනා විෂයයෙහිම සාධාරණව යොද ගනු ලැබේ. එම නිසා දෙවොල් මඩුශාලාව තුළ පුන් කළස් පහකින් යුත් මාලිගාවක ආකෘතිය ගත් තොරණක් රඹ පතුරුවලින් සකස් කැරෙයි. මේවා කලස් ලෙස නොව කොත් සේ ගිණිමද සමහර සම්ප්‍රදයවල එන ලක්ෂණයකි. එකී තොරණෙහි පද්මාසනාරූඪව සිටින සේ පත්තිනි දේවතාවියගේ සිතුවමක් ඇඳ ඇත. තොරණෙහි මැද කවාටයක් සකස් කොට ඒ තුළ පත්තිනි දේවතාවියට හිමි ආභරණ, රන් සලඹ, අඹ වල්ල, හා රතු පාට රෙද්දක්ද තැන්පත් කෙරේ. එමෙන්ම දෙවොල් දෙවියන්ගේ චිහ්නයක් ලෙස සෝලූ ලියක් තැබීමද අවශ්‍යය.

මෙකී ශාලාවෙහි කණුවල දෝතලු වලු, පුවක් වලු, තල් වලු, සහ පොල් වලු ද බඳිනු ලැබේ. මඩුව තුළ මල් යහනාවක් සකස් කෙරේ. මේ හැරුණු විට මඩුවට මුහුණ ලා දෙවොල් දෙවියන් වෙනුවෙන් යහනක්ද සකස් කෙරේ. මේ දෙක අතර මල් යහන් හා වාහල සහ දෙළහ දෙවියන් වෙනුවෙන් පූරාලපලවල්ද තනනු ලැබේ. සමහර පළාතක මහසොහොන්යකා වෙනුවෙන් පිදේන්නක් සකස් කොට එය දහඅට රියනක් උඩින් පූරාල පලක තබයි.[5] දෙවොල් මඩුවක් කරවා ගන්නා ආතුරයා සමහර විටක පූනාව පේ කර ඔප්පු කිරීමට කැමැත්තේ නම් පූනා තටුවක් සකස් කොට ඒ මත දර හතක්, නයි පෙණ හතක් හා කෙමි දෙළසක් ඇති දිවිහිස් පූනාවක් සකස් කර තැබීම කළයුතු වන්නේය. දෙවොල් මඩුව නටා අවසාන කරන්නේ ගරා යකුන් නැටවීමෙන් හෙයින් ගරා යකාට වෙස් ඇඳ නැටීමට හා පැදීමට අවශ්‍ය වන අයිලයක් ගොරක අතු හා මෝල්ගස්වල ආධාරයෙන් පිහිටවනු ලැබේ.

දෙවොල් මඩු ශාන්තිකර්මය සඳහා අවශ්‍ය පූජකයෝ දෙකොට්ඨාසයක් වෙති. නැටීම් සහ ගායනාකරන්නෝ ද පූජා ඔප්පු කරන්නාහු ද කපුවෝය. ඔවුන්ගේ නායකයා කිසියම් දේවාලයක් භාරව සිටින පත්තිනිහාමි ය. එහෙත් අද හැම කෙනෙකුම හැඳින් වෙන්නේ කපුපත්තිනි යන නමිනි[6] එසේ වුවද පිටිසර ගම්වල ගැමියන්ගෙන් දේවා-ලය හා දේවාල පෙරහැර ආදියට ආධාර එකතු කරන පත්තිනිහාමි කෙනෙක් අදත් වෙසේ. අනික් පූජක කොටස නම් බෙර වාදනය කරන ගුරුන්නාන්සේලාය. මෙම කොටස් දෙකට අමතරව දේව අඩුක්කු සකස් කොට ආහාර පිසීම ආදී වැඩවලට උදවු වී තවත් වරෙක නැටුම් පෙළපාලිවල භූමිකාවක්ද[7] රඟන අතවැසියෙක් වෙයි. ඔහු හඳුන්වන්නේ කොට්ටෝරුවා යන නමිනි. විලක්කු පන්දම් සකස් කිරීම හා කපු-පත්තිනිවරුන්ට අවශ්‍ය හහල දීමට හා උඩු වියන් බැඳීම වැනි කටයුතුවලට සහභාගි වන හේනේ මාමාද සිටියි.

දෙවොල් මඩුව පිළිබඳ පුදපූජා රටාව අවස්ථා දෙකකින් සිදුකැරෙයි. පළමුවැනි දින සැන්දෑවෙහි මඩුපේ කිරීමයි. දෙවැනි දින සම්පූර්ණ දේව යාගය පැවැත්වීමයි. මඩු පේ කිරීම නමින් හැඳින්වෙන චාරිත්‍ර දෙවැනි දවසෙහි කරන නියම තෝත්‍රයට පූර්ව

---

5. මෙම දහ අටරියන් උසින් තැනූ මහසොහොන් පිදේන්න හෝකන්දර, අමරගොඩ පාරේ පරණ වත්තේ පියදස මීමනගේ මහතාගේ නිවසෙහි 20.01.79 දින පැවැත්වූ මඩු පූජාවෙහිදී මම දුටුවෙමි.

6. මෙකී ව්‍යවහාර සියල්ලම අමතක කරන නූතනයෝ මොවුන්ට දේව ඇදුරන් යයි ආමන්ත්‍රණය කරති.

7. දෙවොල් මඩුවට අයිති නැති වුවත් ආතුරයාගේ ඉල්ලීම පිට 20.01 1979 දින හෝකන්දර පරණ වත්තේදී රාමයියා මැරිල්ල හා මරා ඉපැද්දීම යන ජවනිකා දෙක රඟ දක්වූ අවස්ථාවේදී රාමයියා ලෙස රඟ පෑවේ විජේදස නම් කොට්ටෝරුවාය.

රංගයක් බඳුය. එතැනදී සම්පූර්ණ තොත්‍රය කරනු ලබන දෙවැනි දවසෙහි ඉෂ්ට කරනු ලබන සියලුම අංග ලක්ෂණ සංක්ෂේපයෙන් ගෙනහැර දක්වති. මෙලෙසින් දවස් දෙකක් තුළ කරනු ලබන මඩු පූජාව වර්තමානයෙහි එක් දවසකින් කරන චාරිත්‍රයක් වී තිබෙනුද දැක්ක හැකිය.[8]

මා පසුගිය වසර දෙළහක පමණ කාල පරිච්ඡේදය තුළ දුටු දෙවොල් මඩු දහයකට[9] ආසන්න ගණනක් සමීක්ෂණයට ලක් කරමින් මෙම ශාන්තිකර්මයෙහි පූජාවිධි රටාව ගැන සම්මතයක් ගෙන හැර දක්වා එහි අර්ථය විග්‍රහයට ලක්කොට වර්තමාන තත්වය පිළිබඳව විමර්ශනයක් කිරීම මෙම ලිපියෙහි පරමාර්ථයයි. මා දුටු දෙවොල් මඩු අතර වඩාත් සාම්ප්‍රදයික ශාන්තිකර්මය ලෙස සැලකෙන්නේ ලංකා කලා මණ්ඩලය හා කලුතර දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශික කලා මණ්ඩලය මගින් සංවිධානය කොට 1966 අගෝස්තු 31 වැනි දින සහ සැප්තැම්බර් පළමුවැනි දින කලුතර මහා විද්‍යාලයීය භූමිභාගයෙහි පැවැත්වුණු දෙවොල් මඩුවයි. එයට කලුතර දිස්ත්‍රික්ක-යෙහි චිර ප්‍රසිද්ධ සියලු කපුපත්තිනිවරු එක්වූහ. ඔවුන්ගේ ප්‍රධානත්වය දැරුවේ එවකට වයසින් අවුරුදු අනූතුනක්ව සිටි රබලියෙ කපු මහත්තයාය. මෙතැනදී සියලු සම්ප්‍රදයවලට අයිති කපුපත්තිනිවරුන් සමග සාකච්ඡා කොට සකස් කළ සාම්ප්‍රදයික පූජා විධි රටාව මෙසේය:

(මෙහි දක්වනු ලබන වේලාවන් හැම ශාන්ති කර්මයකදීම එලෙසින්ම අනුගමනය කරතියි නොසිතිය යුතුය).

### 31.8.1966 – පළමු දින රාත්‍රි 8.20 මඩු පේ කිරීම

### දෙවියන්ට පින් දීම සහ මල් යහන් කැඳවීම

ප්‍රධාන පත්තිනිහාමි විසින් ආරාධනා කරනු ලැබූ ගුරුන්නාන්සේලා පූජා බෙර මංගල්‍යයක් පවත්වති. උඩට ඇල්ලූ උඩු වියන්ද, පයට එලූ පාවාඩද සහිතව සක් පිඹීම් සහ බෙර හඬ මැද්දේ නැගෙනහිර දිසාවෙන් සභා ගර්භයට පිවිසෙන කපුපත්තිනිවරු තොරණ වඳිති. මෙයට පසුව මුකවාඩම් බැඳි කොට්ටෝරුවා නමින් හැඳින්වුණු අඩුක්කු පිසන සේවකයා අඟුරු දුම්මල රැගෙන එයි. එයින් සුවඳ දුම් පූජාවක් තොරණෙහි තබා ඇති පත්තිනි දේවතා හලඹට ඔප්පු කෙරෙයි. ඒ විලාසයෙන්ම කොට්ටෝරුවා එතැනට රැගෙන එන තෙල් ගොට්ට ආතුරයින් පවුලේ නෑදෑහිත මිතුරන් හා ගමේ අය ලවා ද අත ගස්වා ඒ තෙල්වලින් මල්යහන්වල ඇති පහන් දල්වීම කරති.

8. 20.01.79 හෝකන්දර, පරණවත්තේ මඩුව මෙලෙසින් එක් දිනකින් පැවැත්විය.
9. එම දෙවොල් මඩු මෙසේය:

1966.08.10 හොරණ කොබවක බෝධිමලු විහාරය, 1966.08.31 කලුතර මහා විද්‍යාලිය භූමිය, 1967.02.21 හංවැල්ලේ ආටිගල හේමා අභයසිංහ මහත්මියගේ නිවාසය, 1975.–01.11 හොරණ, කුඩා උඩුව, 1976.02.21 හෝමාගම ජම්බුගස්මුල්ල හන්දිය, 1976.07.25 නාවල කිරිමණ්ඩල මාවතට හැරෙන හන්දිය, 1978.09.30 පිළියන්දල දේවාලය, 1978.12.09 කලුබෝවිල මංගල පාරේ විදුහල් බිම, 1979.01.13 වෙරගල, 1979.01.20 හෝකන්දර අමරගොඩ පාරේ පරණවත්තේ මීමනගේ ගෙදර.

මීට අමතරව බැසිල් මිහිරිපැන්න මහතාත්, බුලත්සිංහල රබලියේ කපු මහත්තයාත්, ඔහු පුත් සුදු මහත්තයාත්, ගෝනපොල හෙන්ද්‍රික් සහ පේදිරික් යන මහත්වරුත් මට අමුද්‍රිත පොත් සපයා දුන්හ. සාකච්ඡා වලදී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සන්දෝරිස් ජයන්ත සහ හෝකන්දර ඩී. ඇඩ්වින් තෝමිස් කපුමහතා සහ මාකේවිට ධබලියු. කේ. ඒතියන් අප්පුහාමිද උදවු කළහ.

මේ පහන් දල්වන්නේ නාථ, පත්තිනි, වාහල, දෙළහ, දැඩිමුණ්ඩ, සූනියම්, කතරගම, ශක්‍ර, ශ්‍රී කාන්තාව, විභීෂණ යන දෙවිවරුන් වෙනුවෙනි. මුළු ගම්පිලැස්සටම සෙත් කිරීමට කැඳවන මේ එක එක දෙවියා වෙනුවෙන් වෙන වෙනම කවි ගායනා කරති.

විමන් සරා විසිතුරු කර ගිමන් මලින් වැඩමවන් ඩ
යහන්සරා දෙම් දෙවිඳුට ආතුර දුක මුදු ලන් ඩ
දහන් අසා සබරගමුවෙ හිමි මාලේ වැඩ සිටින් ඩ
සමන් දෙවිඳු කරුණාකර මල්අස්නට වැඩමවන් ඩ

පාත කැළණිපුර ලක්දිව භාරව පුද පඩුරු ගන්ඩ
දෝත මුදුන් දී වැන්දෙමි ආතුර දුක මුදු ගන්ඩ
දැත පුරා දුන් දලුමුර සැණකින් වැඩමවා ගන්ඩ
නාත දෙවිඳු මල් අස්නෙට නියමයි වාහනෙන් එන්ඩ

හැම කපුවෙක්ම මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිති. ඒ නිසා සියලුම දෙවිදේවතාවුන් වෙනුවෙන් එක සමාන කවි රාශියක් මේ ජවනිකාවෙහිදී යෙදවීම නොවැළැක් විය හැක්කකි.

**කප්සිටුවීම - රාත්‍රී 9.30**

පත්තිනිය වෙනුවෙන් සකස් කළ චිහ්නයක් ලෙස සලකන කප යනුවෙන් හැඳින්වෙන පුවක් ගස් කැබැල්ලක් ගොක්කොළවලින් සරසා පොල් ගෙඩි දෙකක් හා පුවක් මල්කිනිත්තක් හෝ දෙකක් එහි හරි මැදින් බැඳ සභා ගැබට ඔසවා ගෙන එනු ලැබේ. කප ආසනයක් මත තබා කහදියර කොතලය හා අඟුරු දුම්මල අල්ලා කහදියර ඉස කපු පත්තිනිවරු ඒ වට කර නැටීමට සූදනම් වෙති. තෝරා ගත් කප ඉතා ශුද්ධවන්ත වස්තුවක් විය යුතු බව කපුවෝ ගායනා කර දක්වති.

ආරා පිරිකුඹු උසින් මහත් වුන
සාරා කනු පිල් උන් සහ දුටු තැන
මෝරා ගසළඩ පමණට දුටු තැන
තෝරා අරගෙන ලකුණු බලා ගෙන

මුල ඇද නම් ආතුරන් වැරැද් දේ
මැද ඇදනම් ඇදුරන්ට වැරැද්දේ
අග ඇදනම් ඒ කපට අසුද් දේ
මෙලෙසින් ලක්ෂණ තෝරා ගද්දේ

මෙම කප මඩුව ඉදිරියෙහි සිටුවා එහි මුදුනෙහි කාල පන්දමක් දල්වති. ඒ කපේ මුදුනේ සිට සිව් කොණට ගොක්කොළ දම්වැල් අදිනු ලැබේ. මේ කප පෙර දිනයක සේරිමාණන් නම් රජුගේ හිස රුජාව සුව කරනු වස් සිටවූවකි. අද කප සිටුවීම සම්බන්ධයෙන් නම් විශේෂත්වයක් තිබේ. කලින් කප් සිටුවා දෙවොල් මඩු තේත්‍රයක් ඔප්පු කරන බවට භාරයක් වූ කල්හි බිසෝකප් සිටුවීමක් කරනු ලැබේ. කිරි ඇති රුකක් සේ සලකන බිසෝකප සතර වියත් සතරඟුල් දිගු වූවකි. එහි පොල්මල් පුවක්

මල් සහ පොල් ගෙඩි දෙකක් බැඳ බිසෝ කපේ කවි කියා මඩුවෙහි සිටුවා කප මුදුනෙහි හැලියකින් වසා තබති. මෙහි සුභාසුභ බැලීමට කොට්ටෝරුවා ලවා පොල් ගෙඩියක් බිඳීමද කළ යුතුය.

### ගෙඩිගේ නැටීම – රාත්‍රී 11.20

ගෙඩිගෙයක් ලෙස පුවක් කඳන්වලින් සකස් කර පොල් වලු බැඳ තබා ඇති තොර ණට පන්දම් දැතෙහි ඇතිව නැඟීමට සැරසෙන කපුවෝ බෙරපදවලට අනුව ඉහළ නැඟ ඒ ඒ තැන සිට නටා එක් පන්දමක් ගෙඩි ගෙය මුදුනෙහි තබා ආපසු බිමට බසිති.

### පූනාව පේ කිරීම – රාත්‍රී 11.45

කෙම් දෙළොසෙහි දල්වන ලද විලක්කු ඇති පූනාව සහිත පූනා තට්ටුවට දුම් අල්ලා ඇටජාති, පැහිරි දලු ආදිය සහිත පඬුරු දමා පූනා උපතේ කවි කියති. සියලු වස්දෙස් එක් කොට පූනාවට දැමියයුතුය. මේ සඳහා පූනාව සහ ආතුරයා හුයකින් සම්බන්ධ කරති. විජය රජු හා කුවේණිය පිළිබඳ වෘත්තාන්තය දක්වන කපුවෝ ඒ විජය රජුගෙන් සත් වැනිව පහළ වුණු විමලදහම් නම් රජකු ගැනත් සේරිමානන් රජකු ගැනත් කරුණු කියති. ඒ රජුට හීනයෙන් දිවියා පෙනීමත් සමඟ හට ගත් හිස රුජාව ගැන සඳහන් කොට පූනාව පේ කරති. ආතුරයා අතට දෙනු ලබන වහන්තරාව නම් රෙද්දකින් හිසේ සිට දෙපතුල දක්වා ''ඕනම නැහැ'' යයි පද කියවමින් අභිනයෙන් වස්දෙස් බස්වා පේ කිරීම අවසාන කරති. රාත්‍රී 12.30 ට පූනාව පේ කිරීමේ කාර්යය අවසන් වීමත් සමගම එදින මඩු පේ කිරීම සම්බන්ධ චාරිත්‍ර පද්ධතියද කෙළවර දකියි.

### 01.09.1966–දෙවෙනි දිනයෙහි පවත්වනු ලබන නියම දෙවොල් මඩුවේ පූජා විධි රටාව

### සවස 3.00 තොටමෙට යාම

දින තුනක් තිස්සේ මත්ස්‍ය මාංශ කෑමෙන් තොරව, ශාකභක්ෂකව, රති කෙළියෙන් වෙන්ව, මුසා බස් සහ පරුස බස් බිණීමෙන් වෙන්ව, ඇප කැප වී ජීවිතය ගත කරන ලද්දහු නමුත් කපු පත්තිනිවරු දෙවොල් මඩුයාගයක් පැවැත්වීම ට කලින් නැවත පරිශුද්ධත්වයට පත් විය යුත්තාහ. එම පිරිසිදුකම ලබා ගැනීමට තොටමෙ නමින් හැඳින්වෙන ඇලක්, දෙලක්, දිය පහරක් හෝ ගඟක් වැනි ජලස්ථානයකට යා යුතුය. නගර බදව එවැනි තැන් සොයා ගැනීම දුෂ්කර නිසා මඩුශාලාවට පැත්තකින් වටතිර ඇද ඒ තුළ පැන් කළයක් ගේනගොස් තබා එතැන ''තොටමෙ'' ලෙස සලකති. මෙම පැන් කළයට සුදු හඳුන්, කහ සහ දෙහි කපා දමා තිබේ. ගුරුන්නාන්සේලා හා හලම් ගත් අත් ඇති පත්තිනිහාමි හා කපුවෝද එතැනට ගොස් මුහුණ හා අත් පැනින් සෝද ගෙන හලම්ද[10] පිරිසිදු කරගනිති. තොටින් හෝ පැන් කළයෙන් හෝ ගත් වතුරින් පුරවා ගත් කහ දියර කොතලයක් ගෙන එන කොට්ටෝරුවා ඒ වතුර තොරණට හා මල් යහන්වලට ඉසියි.

---

10. හලම් – හලඹ – සලම් – සලන් යනුවෙන් හැඳින්වෙන පත්තිනි දේවිය පැළඳි නූපුරයයි.

### ඔරුමාල පිදේන්න ඔප්පුකිරීම[11] - සවස 3.55

මේ පැවැත්වෙන දෙවොල්මඩු ශාන්තිකර්මය නිසා තම අභිමතාර්ථ සාධනය වේවායි පතා කපුවෝ මේ පිදේන්න ඔප්පු කිරීම කරති. නොයෙක් වර්ගවල එළවළු එකට මිශ්‍ර කොට උයන ලද ව්‍යංජනයකින්ද බත් හට්ටියකින්ද ගුලිහතක් ගෙන පහන් තිර හතක් සමඟ දල්වා ඒ සියල්ල ජප කොට වතුර නැඹිලියකට දමති. ඔරුමාල පිදේන්න ඔප්පු කරනුයේ පත්තිනි දේවතාවිය වෙනුවෙනි. සත් පත්තිනි සම්ප්‍රදායෙහි පත්තිනිය හැඳින්වීමට ඔරුමාල පත්තිනියයි ව්‍යවහාරයක් ඇති බැවින් ඇගේ එකී උපත් කථාව මෙහි ලා අනුස්මරණය කිරීමක් සිදු වෙයි.[12]

### මිල්ල කැපීමට යාම - සවස 4.05

දෙවොල් මඩුවල මෙන්ම අනික් මඩු ශාන්තිකර්මවලද පවත්වන විශේෂ චාරිත්‍රයක් නම් ගිනිපෑගීමයි. දෙවොල් දෙවියන් හත් දෙනාගේ ඔරුව කැඩී මුහුද මැද අතරමන් වුණු කල මුහුදු මණිමේකලාවුන් විසින් මවා දුන් ගල්පහුරක් පැද ගෙන මේ දෙවොල් හත් කට්ටුව ලක්දිවට ගොඩ බසින්නට තැත් කළහ. එහෙත් පත්තිනි දෙවියෝ ඔවුන් වැළැක්වූහ. දෙවොල් දෙවිවරු පානදුර, අඟුලාන, මොරටුව, මීගමුව, හලාවත, පුත්තලම, යාපනය, ගොයියපාන, මිරිස්ස, වැලිගම, උනවටුන, රත්ගම, හික්කඩුව යන ස්ථාන පසු කොට සීනිගමට පැමිණ එහිදී ගොඩබැස්සහ. පත්තිනි ඔවුන්ගේ ගමනට බාධා කරමින් ගිනි කඳු හතක් මැව්වාය. එහෙත් දෙවොල් දෙවිවරු ඒ ගිනි කඳු හත නිවා මෙතරට ආහ. ගිනි පෑගීමේදී අනුකරණය කරනු ලබන්නේ මේ සිදුවීමයි.

ගිනි මැලය ගැසීම සඳහා අවශ්‍යවන්නේ මිල්ල දරය. ඒ නිසා මිල්ල ගසක් වුවමනා වෙයි. කැලෑ බදව ගොස් මිල්ල ගස කපා ගෙන ඒමට පිටත් වන කපුවෝ ''නවතොට මුණේ කවි''[13] ගායනා කරති. කැලෑවට ගොස් මිල්ල ගහක අත්තක් කපා එය මල් පස් වර්ගයක් සහිතව සුදු රෙද්දක ඔතා කොට්ටෝරුවාගේ හිස පිට තබා උඩු වියන් යටින් දෙවොල් මඩු ශාලාව වෙත වඩම්මවා දෙවියන්ගේ මල් පැලෙහි තැබිය යුතුයි, ගිනි මැලය[14] ගැසීමට පසුව ගන්නා තුරු.

### බිසෝකප් සිටුවීම - සවස 4.30

පෙර දින රාත්‍රියෙහි කළ පරිදි බිසෝකප ගෙනැවිත් ආසනයක් මත තබනු ලැබේ. කපමුල දණ ගසා වඳින කපුවෝ යහන්වලටද, පූනා තටුවටද කහ දියර ඉසිති. දුම්මල කබල අතට ගෙන එක් කපුවෙක් නටයි. මේ අතර ප්‍රධාන පත්තිනිහාමි තොරන් මාලිගාව ඉදිරිපිට කඩතුරා වස්ත්‍රයක් අදියි. එයින් ආතුරයා සහ තොරන් වෙන් කිරීමක් කරති. පිට මඩුවේ යහන් ළඟටද ගොස් ඒවාට නමස්කාර කරන කපුවෝ කපට පසුපසින් අර්ධ කවාකාර පේළියකට සිට ගනිති. බෙර කරුවෝ ඊට පිටුපසින් සිට ගනිති. තමන්ට නියමිත ගුරුන්නාන්සේ ගේ බෙරපදයට අනුව කපුරාලලා වෙන වෙනම

---

11. සමහර කපු පත්තිනිවරු මේ පිදේන්න නුක්කු පිදේන්න යයි හඳුන්වති. එහෙත් මෙයද අද ව්‍යවහාරයෙන් ඈත්වෙතියි සන්දෝරිස් ජයන්ත පවසයි.
12. ඔරුමාල යයි ව්‍යවහාරයට පැමිණ ඇත්තේ උරමාල යන පදයයි.
13. මෙහිදී නව තොටමුණ යනුවෙන් දක්වෙන්නේ දෙවොල් දෙවියන් ගොඩ බසින්නට තැත් කළ ස්ථාන නවයකි. මේ ස්ථාන නවය අප මුලින් දක්වූ ගමන් මඟට වඩා වෙනස්කම් දක්වයි.
14. මැලය ගැසීමට උදවු වන නිසා මිල්ල කැපීම යන්න සමහර කපු පත්තිනිවරුන් අතර ව්‍යවහාර වන්නේ මැලේකැපීම කියාය.

නටති. සියලුදෙනාම තොරණ හා දෙවොල් යහනාව අතර එකා පසු එකා බැගින් සිටින සේ දුැතලයකින් ගමන් කරති. බිසවුන් වහන්සේ සිට වූ කපේ ආනුභාවයෙන් රජතුමාගේ ලෙඩ දුක් දුරුව ගිය හෙයින් මෙම බිසෝ කප් මංගල්‍යය පැවැත්වූ බලයෙන් ගම් පැලැස්සේ ලෙඩ දුක් දුරු වේවායි පත්තිනිහාමි පැතුමක් ද කරයි.

මිටි තුනක වලක් හාරා එහි බිසෝ කප් සිටුවීම කළ යුතුය.

## හඟල පේ කිරීම — සවස 5.25

හඟල යනුවෙන් හැඳින් වෙන්නේ පත්තිනි දේවිය ලෙස වේශ නිරූපණයට අවශ්‍ය කරන හැට්ටය, සළුව, රෙද්ද ඇතුළු ඇඳුම් කට්ටලයයි– මෙම රෙදි හා හැට්ට ගෙන නමස්කාර කර කහදියර ඉස, අඟුරු, දුම්මල අල්ලා ඒ ඒ යහන වෙතට හඟල ගෙන ගොස් ගෞරව දක්වා තොරණ මැද සකස් කර ඇති කවාටයේ තබති.

## පිදවිලි දීම – සවස 5.50.

තුන් සමයමේ දේවතාවන්ගේ නාමයට සකස් කර ඇති අඩුක්කු ඔප්පු කිරීම මෙහිදී සිදු කැරෙයි.

## පූනාව පේ කිරීම – සවස 6.00

පූනාව හැන්දෑ ජාමයට, මධ්‍යමයාමයට හා අලුයම් යාමයට පේකළ යුතුයයි ශාස්ත්‍ර නියමයක් තිබේ. මෙතැනදී කරන්නේ සැන්දෑ යාමයේ පේ කිරීමයි. විජය කුවේණි කථාව ගෙනහැර දක්වා කුවේණිය වෙළඹ වෙස් මවා ගෙන විජය සමඟ ගොස් යකුන් පොලු ගසා මැරූ අන්දම ප්‍රකාශ කොට එතැනින් සත්වැනිව පහළ වුණු සේරිමාණන්[15] රජුට රෑ සිහිනයෙන් දිවියකු පෙනී හිස රුජාවක් සෑදුණු අන්දම කියැවෙයි. එකී උවදුරු දුරු වූයේ දිවි හිස් පූනාවේ බලයෙනි. එහෙයින් ආතුරයාගේ වස් දොස් දුරු කරවා ගන්නට පූනාවේ පිහිට පතති. පූනාව නැවතත් තටුවේ තැබිය යුතුයි, මද්දිම ජාමයට පේ කිරීමට.

## මල්පහන් දැල්වීම සවස 6.30

ආතුරයා ලවා සියලු මල් යහන්වල ඇති පහන්වලට තෙල් වත් කොට දැල්වීම කරති. යහන්වල විවිධ වර්ණවලින් යුත් මල් එක දෙක තැබීම ද කළ යුතු වන්නේය.

## කාල පන්දම් පූජාව – සවස 6.45

කොට්ටෝරුවාගෙන් ලබා ගන්නා පන්දම් දල්වා ගන්නා කපු පත්තිනිවරු නටමින් දුම්මල ගසා පන්දමින් කීල් නංවා දසදිසාව ඒකාලෝක කරති. කතරගම දෙවියන් වෙනුවෙන් කළ කාලපන්දම් පූජාව පැවැත්වීමට අවශ්‍ය බව කියන කපුවෝ ගෙඩි ගේ මුදුනෙහි කාලපන්දම ගසා බිමට බැස නටති. (ගෙඩි ගේ සෑදීම විශේෂයෙන් අවශ්‍යවන්නේ තුන්ද ගී මඩුවලට සහ හත් ද ගී මඩුවලටයි. එහෙයින් දෙවොල් මඩු පලකදී ගෙඩිගෙයක් තනන්නේ නොමැති නිසා අලුතින් කපක් සිටුවා හෝ සිටවූ කපක් ඇත් නම් ඒ මත්තෙහි හෝ කාල පන්දම දැල්වීම කරති.)

---

15. මුල්ම දෙවොල් මඩු පූජාව කළේ මේ රජු සඳහා යයි කියති. ඒ සඳහා රුවන් වැල්ලේ කපක් සිටුවා තෝරුය කරන ලද්දේ නවගමුවෙහිය.

**තොරන් යාගය සහ තොරන් දැක්වීම සැන්දෑවේ 7.10**

තොරන් මාලිගාව නම් ආකෘතිය පිළිබඳ දීගු පළල සහිතව විවිධ විස්තර දක්වන කවි තොරන් යාගයේ ගැබ් වී තිබේ. තොරන් පිළිබඳ විස්තර ඒවායේ චිත්‍ර රූප ආදිය විස්තර කොට ඒ ඒ කුලයට තොරණ සම්බන්ධ කර දක්වයි.

| | |
|---|---|
| රජ කුලයට රන් තොරණක් නව දවසක් යාග | කළා |
| බමුණු කුලට මිනි තොරණක් සත් දවසක් යාග | කළා |
| වෙළඳ කුලට පිළි තොරණක් පස් දවසක් යාග | කළා |
| ගොවි කුලයට රඹ තොරණක් තුන් දවසක් යාග | කළා |

මින් අනතුරුව තොරණ ආතුරයාට පෙන්වීම සඳහා මීට කලින් ජවනිකාවකදී පත්තිනිහාමි තොරණ හා ආතුරයා වෙන් කර තැබූ කඩතුරාව ඉවත් කර ආතුරයාට තොරණ දක ගැනීමට සලස්වා සෙත් පතති.

**මල් යහන් පිංදීම - සැන්දෑවේ 7.45**

මෙහිදී විභීෂණ, නාථ, සමන්, කතරගම ආදී දෙවිවරුන් මල්යහන්වලට කැඳවා ඔවුන්ට පිං දීමක් කරති. මේ සඳහා වැඩිපුර කවි ගායනා ආදිය නොකෙරෙයි. මීට පෙර දින මඩු පේ කිරීමෙහිදී දෙවිවරුන් මල්යහන්වලට කැඳවීමට ප්‍රමාණවත් කාලයක් ගත වුණු නිසා විය යුතුයි.

**දේවනන් තොරණට වැඩමවීම හෙවත් දේවාභරණ තොරණට වැඩැම්මවීම රාත්‍රී 8.15**

දේවනන්, දේවාභරණ, දේවරන්චාප යන පදවලින් කියැවෙන්නේ පත්තිනි දෙවියන් හඳුන්වන උන් වහන්සේගේ ආයුධය. මෙතැනදී පත්තිනි දේවියගේ සලඹට අමතරව කඩුව, දුන්න, පලිහ, මුගුර සහ සෝලුවද රන් අඹ වල්ලද ගැනෙයි. රතු සාරියක් සහ කොළ පාට හැට්ටයක් ඇඳ මාල වළලු පැළඳ, නුපුර පාද ජාලා ආදියෙන් සැරසුණු පත්තිනිය මොනර පිලක් එක් අතකින් ගෙන හිස මතින් දේවාභරණ වඩම්මවයි.

**මගුල් බෙරපූජාව - රාත්‍රී 9.35**

මෙහිදී සියලුම ගුරුනාන්සේලා යක්බෙරය, දෙවොල්බෙරය, සෝෂක බෙරය යන නම් වලින් හැඳින්වෙන රුහුණු බෙරය බැඳ ගෙන තොරන් ඉදිරියට ගොස් මගුල් බෙර වට්ටම් වයා මංගල භේරි පූජාවක් පවත්වති. මඟුල් බෙර ගැසීමෙන් හඟවන්නේ ශාන්තිකර්මයෙහි එක් සන්ධි ස්ථානයකට පත්වුණු බවයි.

**තෙල්මේ නැටීම - රාත්‍රී 9.45**

මෙතෙක් නිසසලව සිටි කපුවන් සියලු දෙනාටම නැටුම් සඳහා ලැබෙන වැදගත් අවස්ථාවක් ලෙස මෙය සැලකිය හැකිය. තෙල්මේ නටන්නේ දොළහ දෙවියන් වෙනුවෙනි. සියලුම කපුවෝත් කෝඩුකාර නැට්ටුවෝත් මෙහිදී මඩු බසිති. පහතරට නැටුම් වල එන සම්භාව්‍ය ශාස්ත්‍රීය පද කිහිපයක් මෙහිදී නර්තනය කර දක්වති. තෙල්මේ පද දොළහක් තිබේ. ඒවාට නියමිත සුරල් පදද, අඩව් පදද, කස්තිරම් පදද, (ඉරට්ට පද) අන්තාදි පද ද තිබේ. එහෙත් අවාසනාවකට මෙන් අද තෙල්මේ පද දොළහම සම්පූර්ණයෙන් නැටිය හැකි දක්ෂ නැට්ටුවන් දුර්ලභය.

තෙල්මේ නැටීමේදී වාදනය වන මෙම සුරල් පදය වැන්නක් මගින් බලා සිටින පිරිස කුල්මත් කළ හැකිය.

දෙන් ගුඳ ගුඳ ගුඳ ගුඳ තත් තත් රෙගතිත ගත දෙමි //
ගත ගුඳ ගුඳ ගුඳ තත් තත් තත් රෙගතිත ගත දෙමි
දෙමි ගුඳ ගුඳ තත්තත්ගත ගුඳ ගුඳ ගත් තත් දෙමි
ගුඳ තත් ගත ගුඳ තත්ගත තත් තත් ගුඳ ගත් ගත් ගත දෙමි
දෙමි දෙමි
ගුඳ ගුඳ ගත් ගත් ගත් කිරිකිට ගත් රෙගතිත ගත දෙමි
දින්ගත ගතගති ගත ගත් ගහුරගතකු දෙමි
රින් ගතත් ගත ගතකු දෙමි
රුඳ ගත ගුඳ ගත තත් රුඳ ගත ගුඳ ගත තත්තත් තිරකිට ගතකු දෙමි
දෙහින් තිත ගත ගතක්දෙහින් රෙගතක රෙහුඳකදෙමි.

තෙල්මේ පද ඒ ඒ කපුවා සහ ගුරුන්නාන්සේ වෙන වෙන ම නටා අනතුරුව එහිම ද්විගුණ අවස්ථාවක් සේ සැලකිය හැකි පිනුම්, මාලක්කම් සහ බඹරවළලු ගැසීම්[16] යන අංකයට එක් වෙති. උඩ පිනුම්, බඩ පිනුම්, හිටි පිනුම් වැනි විවිධ ආංගික චලන මෙහිදී දක්වති. සමහරු මේස පුටු ආදිය පවා රංග භූමියෙහි ගෙනැවිත් තබා ඒ මත නටමින් අත්දෙකින් හෝ හිසින් සිට ගැනීම වැනි විස්මයාන්විත දර්ශන මවති. මේවා ඇත්ත වශයෙන්ම තෙල්මේ නැටුමට හෝ දෙවොල් මඩුවට සම්බන්ධ අංග නොව නරඹන්නාගේ අවධානය සහ තෙල්මේ නැටුම ඇතුළු අනික් ලඟ ලඟ එන නැටුම් පද්ධතිවල ඇති දීර්ඝකාලීනතාවය සලකා අන්තර්ග්‍රහණය කරන ලද බාහිර අංගය. මෙම ශාන්තිකර්මයෙහිදී තෙල්මේ නැටුම් අවසාන වූයේ රාත්‍රී 1.10ටය. පිනුම් සඳහා තවත් පැය එකකුත් විනාඩි දහයක් ගතවිය.

## දේවනන් තේව කිරීම – අලුයම 2.20

කපුවෝ පච්චවඩම් රෙදිවලින් හිස් මුදුනේ සිට වසා ගෙන ''කියම් කතාවක් පෙර රන් සලඹේ''යයි කියා සලුවේ මැද සලම් තබා සභාවෙහි සිටින හැමදෙනාටම සෙත් කිරීම සඳහා සලම් සැලීම කරති. මෙහි ඇති විශේෂත්වය නම් කපුවා පිටුපස බෙරය වයමින් ගුරුන්නාන්සේද ගමන් කිරීමයි. මෙහිදී ගෙවල්වල යම් යම් අපල උපද්‍රව සම්බන්ධයෙන් භාර භාර වී ඇත් නම් ඒවා පත්තිනි හාමිට භාරදීම කරති. එමෙන්ම අනාගත කාර්යයක් අපේක්ෂා කොට වෙන භාරයක් ඇත්නම් ඒ සඳහා අලුතින් පඬුරු පත්තිනි හාමිට දීමද බලා සිටින්නෝ කරති.

## මහ ජාමයෙහි පූනාව පේ කිරීම - (02.09.1966) දින අලුයම 3.25

සැන්දෑ යාමයෙහි කළ ආකාරයටම පූනාවේ උපත් කවි කියා වස්දෙස් හරිති. දිවි යකු ඒ ඒ දිගින් පැන ගිය බව පවසා සෙත් කොට වස් දෙස් පූනාවට බස්සවා පූනාව ගෙන ගොස් වීදිය තුළ තබනු ලැබේ.

16. එක තැන සිට කරකැවීමයි. බඹර වළල්ල යනු රජයේ කලායතනයෙන් පසු කලක බිහි වූ අත්තනෝමතික ව්‍යවහාරයකි. බඹරයක් මෙන් කැරකීම බඹර වළල්ලයයි අර්ථකතනයක්ද මොවුන් අතර තිබේ.

**පිදවිලි දීම - අලුයම 3.58**

මල් බුලත් පුටුව අසලින් පිදේනි ගෙනැවිත් තබා එයට කහදියර ඉස පිදේන්න තුළ විලක්කු දල්වා මැද කැම ජාති සහිත බත්හැලිය තබා සන්නි යකුන්ට ඔප්පු කරති. එය සුනියම් දේවතාවුන් වහන්සේට කැප[17] කරදෙන බවක් පත්තිනි හාමි කියන කන්නලව්වේ සඳහන් වෙයි.

**වාහල නැටීම - උදේ 4.25**

වාහල යනු දැඩිමුන්ඩ දෙවියන්ටම තවත් නමකියි විශ්වාසයක් පවතියි. එක දිගට බොහෝ වේලාවක් කාහුල් පැළඳ දෙකොන විලක්කුව කටෙහි තබා ගෙන ආවේෂයෙන් මෙන් නටන කපුරාළ ඉතා ප්‍රචණ්ඩ නර්තන විලාසයක් දක්වයි.

**අඹ විදමන - උදේ 6.20**

මෙය නාට්‍යමය අංගලක්ෂණ ඇතුළත් ජවනිකාවකි. පත්තිනි දේවිය පඩි රජුගේ උයනෙහි අකලට සැදුණු මාදිය කළයක් සා විශාල අඹ ගෙඩියක උපත ලත් කතාව මෙහිදී නිරූපණය කෙරෙයි. මහලු වෙස් ගෙන එන ශක්‍රයා මෙම අඹයට විදියි.

අඹ විදමනෙහි කවි ගායනා වන්නේ සාමාන්‍යයෙන් පහතරට ශාන්තිකර්මවලදී භාවිතා නොවන ආකාරයකිනි. මෙහිදී මුල් පාද දෙක එක් කපුවකු ගයන අතර අවසාන පාද දෙක වෙනත් තැනැත්තෙක් ගායනා කරයි. වචනවල අර්ථය හරි හැටි වටහා නොගැනීම නිසා මතු වන සියුම් හාස්‍ය රසයක් මෙම ජවනිකාව පුරා දිස් වෙයි. වෙස් මුහුණක් බැඳ බඩට කොට්ටයක් තබා බැඳ ගෙන ඒ මත කලු කෝට් කබලක් ඇඳ වැරදි විදියට ඉහළ පහළ යන පරිදි බොත්තම් දමා ගත් ශක්‍රයා සැරමිටි වාරුවෙන් සභා ගැබට පිවිසෙයි. ඉන් පසුව මහල්ලා සහ ගුරුන්නාන්සේ අතර ඇති වන සංවාදයකි.

ශක්‍රයා උයනෙහි අකලට හට ගත් අඹය විදින විලාසය දක්වා, ගෙන ආ දුන්නකින් මෙතෙක් තොරන් මාලිගා කවාටයෙහි තබා තිබුණු අඹවල්ල විද සභාවට සෙත් පතයි.

**දෙවොල් නැටීම - උදේ 7.50**

ඉණහැඩය සහ කාහුල් වැනි සම්පූර්ණ ඇඳුම් කට්ටලයකින් සැරසෙන දෙවොල් නැට්වුවෝ දෙවොල් දෙවි සත් කට්ටුව මෙරටට ගොඩ බැසීම අනුරූපණය කරති. දෙවොල් දෙවිවරුන් ආ නැව මුහුද මැදදී බිඳී ගිය අන්දමත්, ගොඩ බසින්නට ඒ ඒ - තැන්වලට ගිය නමුත් පත්තිනි දේවිය බාධා කිරීමත්, පසුව සීනිගමට ගොඩ බැසීමත් කතරගම දෙවිඳුගේ අනුහසයෙන් පත්තිනි මැවූ ගිනි කඳු හත සිසිල්කර ගොඩ බැසීමත් මින් පසුව දෙවොල් යන අභිධානයද දී පත්තිනි දේවිය තමා සමඟ එකම මඩුවක කෙළි පිදේනි ගන්නට ඔවුන්ට වරම් දුන් ආකාරයත් මෙහිදී සංවාද මාර්ගයෙන් කියවෙයි. දෙවොල් පද සහ සුරල් නටා අවසාන වීමත් සමඟ දෙවොල් දෙවියන් එන මඟ අහුරා දිග සුදු රෙද්දක් කඩයක් සේ අඹරා දෙදෙනෙකු විසින් හරහට අල්ලනු ලැබේ. මෙය

---

17. සුනියම් දේවතාවා ගම්භාර දේවතාවා ලෙස සලකන ප්‍රදේශවලදී පමණි.

හඳුන්වන්නේ කඩවත යන නමිනි. එහි දෙපැත්තේ සිටින්නේ ආරච්චි මහත්තයා සහ කංකානම් මහත්තයාත්ය. එතැනට එන දෙවොල් දෙවියෝ ගුරුන්නාන්සේ සමඟ දෙමළ කෙනෙකු සිංහල කතා කරන විලාසයෙන් සංවාදයෙහි යෙදෙති.

විවිධ ප්‍රයත්න දරන නමුත් දෙවොල් දෙවිට මෙගොඩ බැසීමට තිබුණු බාධාව ආරච්චි මහත්තයා සහ කංකානම් මහත්තයා ඉවත් නොකරති.

මෙම අවස්ථාවෙහි විදේශීය දෙවියකු මෙරට අදහනු ලබන යක්ෂ භූත කායට ඇතුළත් කිරීමට ගත් ප්‍රයත්නයක් මැනවින් ප්‍රදර්ශිතයි.[18]

මේ වන විට ඇවිලෙමින් තිබෙන ගිනි මැලයෙහි අඟුරු බැසී ඇත. ඒ වටා චතුරශ්‍රයක් වන පරිදි පොල් මල් හෝ පුවක් මල් කිනිති හතරක් තබා පච්චවඩම් රෙද්ද (ගිනි කඩ) හිසමත පැළඳ ගන්නා දෙවොල් දෙවි ගිනි මැලය පාගයි.

## දෙළහ පෙළපාලිය - උදේ 9.07

මෙහිදී දෙළහ දෙවියන්ගේ නාමයට වස්තු දෙළසක් ඔප්පු කෙරෙයි. තොරණට නමස්කාර කර බිමට දමන ලද රෙද්දක් උඩ ඉඳ ගන්නා කපුවෝ සතර දෙනෙක් විවිධ වස්තු පූජා කොට දෙළහ දෙවියන් වඩම්මා ගෙන ඒමට සැරැසී සිටිති. දෙළහ දෙවියකු වෙනුවෙන් වෙස් මාරු කරන කිසිවකු නොමැති වීම මෙම ජවනිකාවෙහි ඇති විශේෂතාවයයි. මෙහිදී පවත්වනු ලබන පෙළපාලි දෙළහ පිළිවෙලින් මෙසේ විය. උඩු වියන් පාලිය, පාවාඩ පාලිය, ඡත්‍ර පාලිය, සේසත්පාලිය, ධ්වජ පාලිය, චාමර පාලිය, දවුල් පාලිය, හොරණෑ පාලිය, තම්මැට පාලිය, වීනා පාලිය, සක් පාලිය, සහ කොම්බු පාලිය.[19]

දෙළහ දෙවියන් වෙනුවෙන් පාලි දෙළසක් කොට වස්තු දෙළසක් ඔප්පු කිරීමෙන් පවා තෘප්තියට නොපැමිණන කපුපත්තිනිවරු ඒදෙවියන් නමට ඇතෙකුද, මංගර දෙවියන් නමට මී හරකුද බැඳ ඔප්පු කිරීමට සැරසෙති. මේ ජවනිකා දෙක හැඳින්වෙන්නේ ඇත් බන්ධනය සහ මී බන්ධනය යනුවෙනි.

## මරා ඉපැද්දීම - දවල් 11.50

පඬි රජු බිසවගේ මාලය සොරකම් කිරීමේ චෝදනාව පිට රාජභටයින් විසින් පාලඟ අල්ලා ගැනීමෙන් පසුව ඔහු මරණයට පත් කිරීමත් පත්තිනි දේවිය කාලි නම් දසිය සමඟ තම සැමියා සොයා ගෙන ගොස් කොසඹ ගස යට වළලා තිබුණු තම සැමියාට නැවත පණ දුන් කතාවන් මෙහිදී නිරූපණය කෙරෙන්නේ නාට්‍යමය ලක්ෂණ සහිතවයි.

## පූනාව පේ කිරීම, - දවල් 12.10

වස් දෙස් දුරු කරවා ගත් පූනාව වහන්තරාවෙන් ඔතා පත්තිනි හාමිගේ හිස මත තබා ගෙන ඇලක් හෝ දිය පහරක් ළඟට ගෙන යනු ලැබේ. එහි කර වටක් වතුරෙහි බස්වා සිටින ගොනකුගේ ඔලුවෙහි ගසා පූනාව බිඳියි. ගොඩට එන පත්තිනි හාමිට ගරා යකාගේ මුහුණ දැක්විය යුතුයි.

18. මෙවැනිම තවත් අවස්ථාවක් සන්නි යකුමේ කෝල සන්නි යකා ගැනද ඇත.

19. මෙය බෙන්තර පළාතෙහි රට යකුමේදී පවත්වන දෙළහ පෙළපාලියට වෙනස්ය.

### කුරුම්බරපිදවිලි දීම - දවල් 12.40

පාතාල කුරුම්බර, ගිනි කුරුම්බර සහ කලුකුමාර කුරුම්බර ඇතුළු සොළසක් කුරුම්බර දේවතාවුන් වහන්සේලාට පුදන පිදවිල්ල ආතුරයා ලවා ඔප්පු කරවයි.

### ගරා යකුන් නැටීම සහ අයිල් පැදීම - දවල් 1.00

අයිලය මත නගින ගරා යකා එය පදිමින් ගුරුන්නාන්සේ සමඟ සංවාදයෙහි යෙදෙයි. මෙය වස්දෙස් හැරීමෙන් පසුව කරන සෙත් පැතීමයි.

### පිං දීම - සවස 2.40

මෙම ශාන්ති කර්මයට සම්බන්ධ වූ සියලු දෙනාටත්, තමන්හැදූවැඩූදෙමවුපියන්ටත්, සිල්ප ඉගැන්වූ ගුරුවරුන්ටත්, අහසෙහි පොළොවෙහි මේ සක්වළෙහි අරක් ගත් දෙවි දේවතාවුන්ටත් පිං දීමකොට සෙත් කවි කියා පිං බෙර ගසා සවස 3.00 පමණ දෙවොල් මඩු ශාන්තිකර්මය නිමාවට පත් කෙරෙයි.

### වර්තමාන තත්වය

දෙවොල් මඩුව පිළිබඳ මෙහි දක්වා ඇති පූජා රටාව අද අවුල් වී ගොස් ඇත. මෙකී අවුල පසුගිය දශක දෙක තුළ සිදු වූවකි. 1961 අගෝස්තු මස විශ්වවිද්‍යාලයේ සමාජ-විද්‍යා සංගමය පේරාදෙණියේ ජීම්නේසියම් ශාලාවෙහි පැවැත්වූ ''ගම්මඩුව'' ට වඩිග පටුනක් සහ සුද්ධමාත්‍රා නැටුමද ඇතුළත් විය. මේදෙකම යක් තොවිල්වල එන නැටුම්ය. අනික මෙහි කෝල් මුර එකක්වත් රඟ දක්වා නැත. එහෙයින් එය ව්‍යාජ ''ගම්මඩුවක්' වන අතර හැඳින්විය යුත්තේ දෙවොල් මඩුවක් යනුවෙනි.

වර්තමානයෙහි නගරබදව පවත්වන දෙවොල් මඩු ප්‍රචාරණය කරන්නේ ''ගම්මඩු'' යන සාවද්‍ය ව්‍යවහාරයෙනි. මේ නිසා ආධුනික පර්යේෂකයා වියවුලට පත් වෙයි. 1978 දෙසැම්බර් මස නව වැනි සහ දස වැනි දිනවල, කලුබෝවිල මහා විද්‍යාලය ඉදිරිපිට පැවැත්වූ දෙවොල් මඩුව සඳහා ආරාධනා යවනු ලැබුයේත්, මුද්‍රිත වැඩ සටහන් යවා තිබුණේත් ''ගම්මඩුව'' යනුවෙනි.[20] එහෙත් ගම්මඩුවක නැටියයුතු එකද කෝල් මුරයක් හෝ පවත්වනු නොලැබූ අතර පවත්වන ලද්දේ දෙවොල් මඩුවකි. එහෙයින් අද ගම්මඩු යන සාවද්‍ය ව්‍යවහාරයෙන් පවත්වනු ලබන්නේ අන් කිසිවක් නොව දෙවොල් මඩු යයි පිළිගැනීම වඩාත් සාධාරණය.

### සශ්‍රීකත්ව වර්ධක ශාන්තිකර්මයක්

දෙවොල් මඩුව ශාන්තිකර්මය සඳහා මුළු ගමින්ම ආධාර එකතු කිරීම සිරිතකි. ගම්වල මෙන්ම නගරවලද තැන තැන පිහිටුවා ඇති පත්තිනි දේවාලවල පත්තිනි හාමි කෙනෙක් හෝ කපුවෙක් සිටියි. ඔහු ගම පුරා ඇවිද ඒ ඒ ගෙවල වෙන් කර තබා ඇති දෙවියන්ගේ හාල් එක් රැස් කර ගනියි. කුඹුරු ගොවිතැන් කරන ගම්වල නම් හැම ගෙදර කම අස්වැන්න කපා පාගා ගත් පසුව වෙන් කරන අක්යාල එකතු කර ගන්නේ ඔහුය.

---

20. කලුබෝවිල සිරිල් සී. පෙරේරා මහතා මේ ලියවිලි මට ලබා දුන්නේය.

ඒ දේව දානය සඳහාය. ගම්පහ පළාතේ දම්මඩු සහ දේවාල මඩු නටන්නේද කුඹුරු කපා පාගා ගෙදරට ගෙනා පසුවයි. සීලය ආරක්ෂා කළ පත්තිනි දේවතාවිය විමසනු පිණිස පාණ්ඩි ශක්‍රයා ඉදිරියෙහි ඇය කලල් ගා ලබා ගත් ඇල් වීයෙන් බතක් පිළියෙළ කර දීමක් ගැනද කියැවෙයි. අපේ අධ්‍යයනයට පාත්‍රවුණු කලුතර පවත්වන ලද දෙවොල් මඩු පූජාවෙහිදී මෙන්ම අනික් කවර දෙවොල් මඩුවකදී වුවත් අනුගමනය කරන පූජා රටාව විමසා බලන විට ස්ත්‍රී පුරුෂයන් අතර පවත්නා ලිංගික සම්බන්ධතාව අනුරූපණය කිරීමෙන් පොළොවෙහි සශ්‍රීකත්වය වර්ධනය වෙතියි යන විශ්වාසය මෙම ශාන්ති කර්මයටද පසුබිම් වී ඇතිබව පෙනේ. කුරුම්බර පිදවිලි දීම, කාල පන්දම් පූජාව, කිරි ඉතිරීම, ගරා යක් නැටුම යන සියලු අංග ලක්ෂණ මෙන්ම ශාන්තිකර්මයේ අවසාන භාගයද මගේ නිගමනයට හේතුභූත වූ බව සඳහන් කළ යුතුයි. එකී පූජාකර්මයක අවසාන කොටස් සංක්ෂිප්තව දක්වා මගේ මතය තහවුරු කිරීම මැනැවැයි මම සිතමි.

දෙවොල් පද සහ සුරල්පද නටා සන්ධිස්ථානයකට එළඹුණු බව ප්‍රකාශ කොට මඳකට ශාන්තිකර්මය නවත්වන කපු පත්තිනිවරු මෙසේ කියති.

කපුවා: කෝ මෙතන ඉන්න ආතුර මහත්තයාල. මේ ළමයින්ගේ කෑ ගැහිල්ල වැඩියි. අපි මෙතන කුණුහරුප කියනවද දන්නෙත් නැහැ නේ. එහෙම නේද ගුරුන් නාන්සේ.

ගුරුන්නාන්සේ: ඔව් ඔව් දැන් ඉතින් මෙතන කිරි වැක්කෙරෙනකන් වැඩේ කෙරෙන වෙලාව.

කපුවා: ඔව් කිරිටික හට්ටියෙන් පිටට වැක්කෙරෙන කන් තමයි. අපේ කොට්ටෝරු උන්නැහේ ඔය කිරි ඉතිරිල්ලට සූදානම් වෙන්නෙ.

මේ කොටස අවසන් කළ පසුව කුරුම්බර පිදේන්න කුරුම්බර යකුන් සඳහා ඉදිරිපත් කැරෙයි. මෙහිදී පුද ගන්නට අඬ ගසන කලුකුමාර කුරුම්බර යකා රතිකෙළියෙහි ලොල්ව යහන්වල ගැහැණුන්ට තුරුල් වී නිදන්නෙකි. මෙවැනි කාමුක යකකුට පිදවිනි ඔප්පු කිරීමෙන් අනතුරුව, ගරා යකුන් නැටීම සිදු කැරිණි. මෙහිදී ගරා යක්කු දෙදෙනෙක් සභාවට ආහ. මේ ගරා යක්කු දෙදෙනා සැමියා හා බිරිඳගේ භූමිකාවන් රඟ පෑහ. දෙදෙනා මුහුණු දෙක එකට ළං කොට සිඹ ගැනීම කරති. කකුල් දෙපැත්තට දමා කකුල් පටලවති. පියවුරු අල්ලති, පිරිමදිති. වාඩිවෙන්නැයි ගුරුන්නාන්සේ ඉල්ලූ කල එකෙක් අනිකාගේ උකුල මත වාඩි වී බෙල්ල බදා ගනියි. මේ සියල්ලම අභිරමණයෙහි පූර්ව අවස්ථාවක් ලෙස ගිණිය හැකිය.

ගරා යකා: මෙයාගෙයි මගෙයි ගෙදර ඉන්දෙද්දී වැඩේ ම ඉඹගන්න එකයි. එයා මගේ ඉඹිනවා, මත් එයාගෙ ඉඹිනවා. (මුහුණ ළං කෙරෙයි)

අනිකා: අනේ නිකා ඉන්නකෝ,

ගරා යකා: චුට්ටක් දෙන්නකෝ.

අනිකා: බෑ අනේ ඔයා කරන කොට හරියට රිදෙනවා.

ගුරුන්නාන්සේ: ඔහොම තමයි අලුත් පිට. පස්සෙ ඕව නිකම් ගහට කොටන් දමනවා වගේ.

අනිකා: ඒක තමයි. එයාගෙ වැඩේම මට රිද්දන එකයි. හැම වෙලාවටම ඕන.

(මින් පසුව අයිල පදින්නට සැරසෙන ඔවුහු මෙසේද කියති.)

ගරා යකා: ටිකක් කකුල් පළල් කරන්නකෝ.

අනිකා: අනේ බැහැ අනේ රිදෙනවා.
(මින් පසුව අයිල පැදීමේදී ඔවුන් අනුකරනුයේ ලිංගික කාර්යය නොවේද?

ශාරීරික රිද්මය එයයි. මෙසේ මඳ වේලාවක් ගත කොට,)

ගරා යකා: කෝ අනේ මගේ මූහුද?

ගුරුන්නාන්සේ: මුහුද නෙවෙයි මුහුණ. ඒක බලා ගන්න නම් කැටපතක් ඕන.

ගරා යකා: ඉතින් ඒක ගෙනැල්ල දීපන්කො.

(කොට්ටෝරුවා පොල් බැයක වට රවුමක් හීන් තීරුවක් සේ කපා ගෙනැවිත් අල්ලයි. ගරා යකා ඒ තුළට අත දමන්නට අවශ්‍ය වුවත් එහි අත නොදමා ඒ වටා අතයවයි.)

ගරා යකා: උස්සල අල්ලන්නකෝ. ඔහොම අල්ලාල දන්න පුලුවනෑ.

(බොහෝ වේලාවක් තැත් කොට අනතුරුව අත ඒ තුළට දමා ඉහළට පහළට යවමින් ලිංගික ක්‍රියාව අනුකරණය කරයි.)

ගුරුන්නාන්සේ: තමුසෙට ඕන හැම වෙලාවටම දමන ඒවා වගෙයි. ඕක දමන එකක් නෙවෙයි. බලන එකක්.

(මින් අනතුරුව කෑමට ගෙන එන කැවුමක් සහ කෙසෙල් ගෙඩියක් අතින් ගෙන කැවුම මැද කෙසෙල්ගෙඩිය සිටුවා එය ඇතුලට තද කිරීම අනුකරණය කරයි.

නැවතත් එකිනෙකා සිප ගන්නා ගරා යක්කු කකුලින් කකුල පටලවා ගෙන අයිලපද්දති.)

මෙකී සංවාදවලින් ගරා යකුමේදී ඉදිරිපත් කරන්නේ ලිංගික කාර්යය සංකේතවත් කිරීමක් බව පැහැදිලි වනු ඇත. ලිංගික කාර්යය අනුකරණය කිරීම සශ්‍රීකත්ව වර්ධනයේ අනුරූපණයකි. එමෙන්මදෙවොල් මඩුවෙහිදී පුරුෂලිංගයක සංකේතයක් මඩු ශාලාවෙහි පෙරදින සැන්දෑවෙහි සිට තබා තිබුණු බවද මෙහිදී සිහිපත් කළ යුතුයි. ඒ ආකෘතිය නම් බිසෝකපයි. බිම සිටුවන ලද කපේ පහළ කෙළවරේ පොල් ගෙඩි දෙකක් ද වටේ පොල් මල් කිනිතිද බැඳ තිබේ. මුදුනෙහි හැලියක් අනික්පැත්තට හරවා වසා තිබේ. මේ නිසා බිසෝකප පුරුෂ නිමිත්තක ආකෘතිය දරයි. එහෙයින් දෙවොල් මඩු ශාන්ති කර්මය ලිංගික කාර්යය අනුකරණය කොට දක්වන සශ්‍රීකත්ව වර්ධක ශාන්ති-කර්මයක් සේ අර්ථ කථනය කළ හැකිය.